# මහ මැතිවරණයට අදාළ නියෝගවලට දේශපාලන පක්ෂ කිසිදු අවධානයක් යොමුකර නැහැ

## පැෆරල් සංවිධානය

**ජේ.ටී. ද සිල්වා**

කොවිඩ්-19 රෝගය පාලනය කිරීම සඳහා පනවා ඇති ඡන්ද විමසීම්වලට අදාළ නියෝග පිළිබඳව සමහර දේශපාලන පක්ෂ හා ඔවුන්ගේ රැස්වීම් සංවිධානය කරන්නන් විසින් කිසිදා අවධානයක් යොමුකර නැති බව පැෆරල් (නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සඳහා වූ ජනතා ක්‍රියාකාරීත්වය) වැඩබලන පොලිස්පතිවරයාට ලිපියක් එවමින් අවධානය යොමුකර තිබේ.

2020 අංක 1 දරන 2019 කොවිඩ් -19 ඡන්ද විමසීම් ගැසට් පත්‍රය රෝගය පාලනයට පනවා ඇති රෙගුලාසි මෙලෙස නොසලකා හැරීම නිසා පාර්ලිමේන්තු මැතිවරණයටද බලපෑමක් විය හැකිය. එය සෞඛ්‍ය අවදානමක් ඇති විය හැකි බවද එමඟින් පෙන්වා දී තිබේ.

නිරෝධායනය හා රෝග වැළැක්වීමේ ආඥාපනතේ 6 වැනි වගන්තිය අනුව එවැනි නියෝග කඩ කරන්නන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට පොලිසියට බලය ඇතත් එවැනි පියවර ගැනීමක් සිදු නොවන බවද පැෆරල් විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා පෙන්වා දී තිබේ.